සැ. යු. - 2014.01.03 දින පළ වූ අංක 1,844 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,845 - 2014 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2014.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 38 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 41 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 45 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

37 - B 80800 - 2,935 (2014/01)
B4 –

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හම්බන්තොට

### භාණ්ඩ වෙන්දේසි කිරීම

මෙම අධිකරණය විසින් රාජසන්තක කරන ලද හෝ නියමිත දිනට හිමිකම් නොපෑ භාණ්ඩ පිළිබඳ වෙන්දේසියක් 2014.01.25 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී පැවැත්වෙන බව මෙයින් සියලු දෙනාටම දැනුම් දෙනු ලැබේ.

මෙම භාණ්ඩ මිලදී ගනු ලබන අවස්ථාවේ දී නියමිත මුදල් ගෙවා රිසිට්පතක් ලබාගත යුතු ය. චෙක්පත්, මුදල් ඇනවුම් භාරගනු නොලබන අතර මිලට ගන්නා භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මෙහි සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියේ දිනට පෙර දින තම හිමිකම් ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වනු ලැබේ.

රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය පිට එදින පෙ. ව. 9.00-9.45 දක්වා භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගනු ලැබේ.

වෙන්දේසියෙන් බඩු මිලදී ගැනීම සඳහා පැමිණෙන සෑම අයෙක් ම තමාගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,<br>හම්බන්තොට.

2013 දෙසැම්බර් මස 17 වැනි දින,<br>හම්බන්තොට දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසිය සඳහා ඇති භාණ්ඩ විස්තරය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 14570 | වැසි අංකය එස්වයිඊටී 1001 දරන අබලන් සීෆෑන් අත් ට්‍රැක්ටරය | 01 |
| 02. | 85043 | අංක 77-2351 දරන අබලන් සීෆෑන් අත් ට්‍රැක්ටරය | 01 |
| 03. | 35241 | අංක 34-0763 දරන අබලන් වෑන් රථය | 01 |
| 04. | 82691 | අංක 72-2795 දරන අබලන් සීෆෑන් අත්ට්‍රැක්ටරය | 01 |
| 05. | 10433 | අංක 78-5618 දරන අබලන් සීෆෑන් අත් ට්‍රැක්ටරය | 01 |
| 06. | 77839 | අංක 75-7799 දරන අබලන් සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටරය | 01 |
| 07. | 92570 | අංක 01137 දරන අබලන් සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටරය | 01 |
| 08. | ඒ. ආර්. 539/11 | අංක 114-1368 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 09. | ඒ. ආර්. 497/10 | අංක 206-0302 දරන අබලන් ත්‍රීවීල් රථයක් | 01 |
| 10. | ඒ. ආර්. 358/08 | අංක 105-0325 දරන අබලන් යතුරු පැදිය | 01 |
| 11. | 2895 | යකඩ කොටස් | - |
| 12. | බී ආර්. 1029/12 | යකඩ කොටස් | - |
| 13. | 46053 | සූට්කේස් පෙට්ටිය | 01 |
| 14. | 68185 | ඇල්මිනියම් මුට්ටි | 01 |
| | | ඇල්මේනියම් හට්ටි | 03 |
| 15. | 10992 | අඩි 08 පමණ දිග යකඩ පිලි | 01 |
| 16. | 11072 | ප්ලාස් වර්ගයේ වතුර මෝටර් | 01 |
| | | අඩි 18ක් පමණ දිග අගල ප්‍රමාණයේ වතුර බට | 01 |
| | | අඩි 31ක් පමණ දිග වයර් | 01 |
| | | ඇලෙක් වර්ගයේ කටුව සහිත ඩ්‍රිල් | 01 |
| | | අගල් 15ක් පමණ දිග ඩ්‍රිල් කටු | 01 |
| | | අගල් 14ක් පමණ දිග ඩ්‍රිල් කටු | 01 |
| | | ලී මිට සහිත කුළුගෙඩි | 01 |
| | | විවිධ ප්‍රමාණයේ ගල් කටු | 05 |
| | | යකඩ අඬු | 01 |
| | | ප්ලාස්ටික් තාච්චි | 01 |
| | | අලවංගු | 01 |
| | | යකඩ මිට සහිත මුල්ලු | 01 |
| | | උදලු | 02 |
| | | ප්ලාස්ටික් බාල්දි | 01 |
| | | තන්ගුස් කඹ | 01 |
| | | ගල්කඩන මිටි | 01 |
| 17. | බී. ආර්. 112/2005 | ලීටර් 500 ජල ටැංකි | 02 |
| 18. | 30925 | අබලන් පාපැදි | 01 |
| 19. | 34107 | අබලන් පාපැදි | 01 |
| 20. | 65465 | අබලන් පාපැදි | 01 |
| 21. | 37932 | අබලන් පාපැදි | 01 |
| 22. | 70519 | අබලන් පාපැදි | 01 |
| 23. | 56590 | අබලන් පාපැදි | 01 |
| 24. | 59511 | අබලන් පාපැදි | 01 |
| 25. | 70819 | අබලන් පාපැදි | 01 |
| 26. | 62577 | අබලන් පාපැදි | 01 |
| 27. | 74853 | අබලන් පාපැදි | 01 |
| 28. | 11643 | යකඩ පටි | 27 |
| 29. | 1942 | ඉන්ටර් ලොගින් වර්ගයේ බ්ලොක් ගල් | 150 |
| 30. | 9192 | බාල්දි | 01 |
| 31. | 9196 | ඉල්ලංකුරු | 01 |
| 32. | 9194 | ගැරුම් වට්ටි | 01 |
| 33. | අංක රහිත | ප්ලාස්ටික් බූලි තොගයක් | |
| 34. | අංක රහිත | දිරාපත්වූ දර තොගයක් | |
| 35. | අංක රහිත | බැරල් පාරු | 01 |
| 36. | අංක රහිත | බෝතල් තොගයක් | |
| 37. | අංක රහිත | ගැරුම් වට්ටි | 04 |
| 38. | අංක රහිත | කුඩ | 04 |
| 39. | අංක රහිත | ප්ලාස්ටික් ජෝගු | |
| 40. | අංක රහිත | ගැලුම් 45 හේ යකඩ බැරල් | 02 |
| | | කුඩා බැරල් | 07 |
| 41. | අංක රහිත | ලීටර් 500 ජල ටැංකි | 01 |

01-258

## කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ හා කාර්යාලයෙන් ඉවත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කාර්යාලයෙන් ඉවත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2014.01.26 වැනි දින පැය 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ එදින පැය 8.45 සිට පැය 9.15 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට හැකි ය.

03. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් එදින පැය 9.45 ට පෙර ස්වකීය හිමිකම් මෙම අධිකරණය වෙත තහවුරු කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී හා වෙනත් හේතූන් මත එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර මිලදී ගන්නා භාණ්ඩ එදින පැය 16.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

රවීන්ද්‍ර ප්‍රේමරත්න,
මහෙස්ත්‍රාත්,
කුරුණෑගල.

2013 දෙසැම්බර් මස 24 වැනි දින,
කුරුණෑගල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

ප්‍රසිද්ධ වෙන්දේසිය - 2013

**මහෙස්ත්‍රාත් අධිකරණය - කුරුණෑගල**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 30623/11 | NWVE 7044 බජාජ් ඩිස්කවරි 135 යතුරු පැදිය |
| 02. | 33753/11 | 113-7475 දරන හොණ්ඩා MD 90 යතුරු පැදිය |
| 03. | 5571(බී. 651/09) | ලියාපදිංචි නොකළ සුසුකි යතුරු පැදිය |
| 04. | නඩු අංක රහිත | ලියාපදිංචි නොකළ හොණ්ඩා X- TRAIL යතුරුපැදිය |
| 05. | A 578/10 | 130-0997 හොණ්ඩා යතුරු පැදිය |
| 06. | A 286/13 | ලියාපදිංචි නොකළ බජාජ් ඩිස්කවරි යතුරු පැදිය |
| 07. | නඩු අංක රහිත | හොණ්ඩා EXPRESS MOPED වර්ගයේ යතුරුපැදිය |
| 08. | නඩු අංක රහිත | ලියාපදිංචි නොකළ හොණ්ඩා CD -125 යතුරු පැදිය |
| 09. | 21434/10 | 144-6156 දරන හොණ්ඩා යතුරු පැදිය |
| 10. | නඩු අංක රහිත | හොණ්ඩා MD-90 යතුරු පැදිය |
| 11. | A 146/12 | ලියාපදිංචි නොකළ විනර් වර්ගයේ යතුරු පැදිය |
| 12. | 72870/07 | යමහා මේට් 50 යතුරු පැදිය |
| 13. | A 542/13 | 96-7950 යමහා මේට් යතුරු පැදිය |
| 14. | A 446/13 | ලියාපදිංචි නොකළ LONCIN යතුරු පැදිය |
| 15. | A 446/13 | ලියාපදිංචි නොකළ LONCIN යතුරු පැදිය |
| 16. | A 145/12 | ලියාපදිංචි නොකළ බජාජ් කැලිබර් යතුරු පැදිය |
| 17. | A 446/13 | ලියාපදිංචි නොකළ RANO MOTO යතුරුපැදිය |
| 18. | A446/13 | ලියාපදිංචි නොකළ බජාජ් CT - 100 යතුරුපැදිය |
| 19. | 29481/11 | ලියාපදිංචි නොකළ LML GRAPTOR-150 යතුරු පැදිය |
| 20. | 19597/10 | ලියාපදිංචි නොකළ HONSAN වර්ගයේ යතුරු පැදිය |
| 21. | නඩු අංක රහිත | ලියාපදිංචි නොකළ LONCIN LX - 100 යතුරුපැදිය |
| 22. | නඩු අංක රහිත | අංක රහිත යමහා යතුරු පැදිය |
| 23. | නඩු අංක රහිත | 117-3033 සුසුකි ට්‍රේල් යතුරු පැදිය |
| 24. | නඩු අංක රහිත | U 82 Y 01008 දරන නිකල් පාට පාපැදිය |
| 25. | නඩු අංක රහිත | S 595864698 දරන රෝස පාට කාන්තා පාපැදිය |
| 26. | නඩු අංක රහිත | 0563216 අංක දරන මවුන්ටන් කැට් වර්ගයේ පාපැදිය |
| 27. | නඩු අංක රහිත | S 58184 කලුපාට කාන්තා පාපැදිය |
| 28. | නඩු අංක රහිත | 03647 ලා දම් පාට කාන්තා පාපැදිය |
| 29. | නඩු අංක රහිත | BOX 07214 ECOPAL ලා රෝස පාට කාන්තා පාපැදිය |
| 30. | නඩු අංක රහිත | 61095978 මළ බැදුනු පාපැදිය |
| 31. | නඩු අංක රහිත | TIB 22926 කොළ පාට කාන්තා පාපැදිය |
| 32. | නඩු අංක රහිත | S 5 ඒ 1872 කලු පාට කොළ ඉරි සහිත BRDGESTON හා ACCOD නමැති කාන්තා පාපැදිය |
| 33. | නඩු අංක රහිත | සිංගර් සුපර් කළු පාට පාපැදිය |
| 34. | නඩු අංක රහිත | අංකය අපැහැදිලි MARIPOSA යනුවෙන් සඳහන් නිකල් පාට පාපැදිය |
| 35. | නඩු අංක රහිත | 51718316 රදන කලුපාට ලුමාලා පාපැදිය |
| 36. | නඩු අංක රහිත | අංකය අපැහැදිලි ලා නිල්පාට හා නිකල් පාට කෙන්ස්ටර් පාපැදිය |
| 37. | නඩු අංක රහිත | අංකය අපැහැදිලි කලුපාට පාපැදිය |
| 38. | නඩු අංක රහිත | 01186 H වර්ණය අපැහැදිලි අබලන් පාපැදිය |
| 39. | නඩු අංක රහිත | 4847276 ලා නිල් පාට හීරෝ රෝයල් වර්ගයේ පාපැදිය |
| 40. | නඩු අංක රහිත | අංක UM 38137 දරන කලුපාට රැලේ පාපැදිය |
| 41. | නඩු අංක රහිත | අංක අපැහැදිලි රතුපාට පාපැදිය |
| 42. | A 1143/09 | LUMALA කහපාට පාපැදිය |
| 43. | A1147/09 | HC 2170670 දරන අවුට් ලෝ පාපැදිය |
| 44. | A 1916/09 | කහ රෝස නිල් හා කොළ වර්ණ ගන්වා ඇති පාපැදිය |
| 45. | A 416/10 | කලුපාට හීරෝ රෝයල්න වර්ගයේ පාපැදිය |
| 46. | A 895/10 | S 4101586 නිකල් පාට පාපැදිය |
| 47. | නඩු අංක රහිත | අංක අපැහැදිලි කහපාට පාපැදිය |
| 48. | නඩු අංක රහිත | අංකය අපැහැදිලි AVON කලු පාට පාපැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 49. | A 248/10 | රෝද 3 ආබාධිතයන් සඳහා වූ පැදි 01 |
| 50. | A 866/12 | ඉමී අංක 356246/04/66765/5 නොකියා 1280 ජංගම දුරකථනය |
| 51. | A 273/09 | ඉමී අංක 359181003297426 මෝටර් රෝලා ජංගම දුරකථනය |
| 52. | A 172/10 | ඉමී අංක : 359307/02/322289/2 නොකියා 1650 වර්ගයේ ජංගම දුරකථනය |
| 53. | 59434/13 | මයික්‍රොමැක්ස් වර්ගයේ කළු හා කොළ පැහැති ජංගම දුරකථනය |
| 54. | 71338/පීසී | ග්‍රිල් අච්චු කෑලි කිපයක් |
| 55. | 71338/පීසී | අඩි 8ක් උස කොන්ක්‍රීට් කණු 02යි |
| 56. | A 497/12 | යකඩ කපන මැෂිම |
| 57. | A 1526/09 | දුරකථන කම්බි රෝල |
| 58. | 57129/13 | චේන් ෂෝ 01 |
| 59. | A 169/10 | SAER P M 45 වර්ගයේ වතුර මෝටරය |
| 60. | 59911/එම්අයි/13 | යකඩ මිටි 01 හා තාරස්සන 02 යකඩ බාල්දිය හා කඹය |
| 61. | 43831/එම්.අයි/12 | අත් පොරව |
| 62. | A 2142/11 | ෂෙල් වර්ගයේ ගෑස් සිලින්ඩරය |
| 63. | A 716/09 | ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය ගෑස් ලිප් 01 |
| 64. | 39793/11 | පුලිය සහිත කියත් තල |
| 65. | 44347/11 | පුලිය සහිත කියත් තල |
| 66. | 43228/11 | පුලිය සහිත කියත් තල |
| 67. | 33212/11 | පිලිය සහිත කියත් තල |
| 68. | 31247/11 | කියත් තල 01 |
| 69. | 40307/11 | කියත් තල 01 |
| 70. | 36976/11 | කියත් තල 01 |
| 71. | 29668 | ගෑස් ලිප් 01 |
| 72. | 22981 | ගෑස් ලිප් 01 |
| 73. | 55435 | ගෑස් ලිප් 01 |
| 74. | නඩු අංක රහිත | කොහු කඹ 02, වෑ තල 01 අත්පොරව හා යතුතල 01 |
| 75. | නඩු අංක රහිත | චිත්ත 01යි, කුඩා තුවා 01යි, අත්ඔරලෝසු 02යි. කුඩ 01යි |
| 76. | නඩු අංක රහිත | තෙල් මනින කරඩි 02ක් හා ඇණ තොගයක් |
| 77. | නඩු අංක රහිත | මන්නා පිහි 02, අත් කියත් 02, වෑය 01යි |
| 78. | 59050 | ඔරලෝසු බැලන්ස 01යි |
| 79. | 59051 | තැටි තරාදි 01යි |
| 80. | 59046 | ඔරලෝසු තරාදි 01යි |
| 81. | 59052 | තැටි තරාදි 01යි |
| 82. | A 169/10 | වර්ගය අපැහැදිලි වතුර මෝටරය |
| 83. | නඩු අංක රහිත | ගෑස් ලිප් 01යි |
| 84. | නඩු අංක රහිත | වොටිජ් ටෙක් වර්ගයේ ජල කරාම 01යි, ටී සොකට් 01යි |
| 85. | නඩු අංක රහිත | මුලු මට්ටම්, අඩුමිටිය, බෝල මිටිය |
| 86. | 50169/12 | කියත් තල 01යි |
| 87. | 54114/12 | කියත් තල 01යි |
| 88. | 36263/11 | කියත් තල 01යි |
| 89. | 38864/11 | කියත් තල 01යි |
| 90. | නඩු අංක රහිත | සවල් කිහිපයක් |
| 91. | A 1581/08 | යූ. පී. එස්. 02ක් |
| 92. | නඩු අංක රහිත | බැරල් තොගයක් |
| 93. | 60548/13 | ගෑස් ලිප් 01,ගෑස් සිලින්ඩර් 01යි |
| 94. | නඩු අංක රහිත | බඩ්රි තරාදිය |
| 95. | නඩු අංක රහිත | පොරව 02යි, වප් පිහි 06, පිහි 02යි |
| 96. | නඩු අංක රහිත | උදලු 05යි, බන්ඩි කියත් 01 යි |
| 97. | නඩු අංක රහිත | තැටි තරාදි 02යි |
| 98. | නඩු අංක රහිත | බන්ඩි කියත් 01, බෝල මිටිය |

**කාර්යාලයෙන් ඉවත් කරන ලද භාණ්ඩ**

| අනු. අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| 99. | 983374 පැසිට් සිංහල යතුරු ලියනය |
| 100. | 669093 පැසිට් සිංහල යතුරු ලියනය |
| 101. | 983397 පැසිට් සිංහල යතුරු ලියනය |
| 102. | 965036 පැසිට් සිංහල යතුරු ලියනය |
| 103. | පිල්ටර් ස්ටෑන්ඩ් 01යි |
| 104. | ටියුබ් බල්බ ආවරණ 07 |

01-304

---

**පොලිස් දෙපාර්තමේන්තුව - හලාවත කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ හලාවත කොට්ඨාසයට අයත් පොලිස්ථාන සහ කාර්යාලවල පාවිච්චිකර පාවිච්චියට ගත නොහැකිව ගර්හිත කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2014 ජනවාරි මස 29 වැනි දින පැය 10.00 ට හලාවත පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වේ.

2014 ජනවාරි මස 28 වැනි දින පැය 14.00 සිට 16.00 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකි ය.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයන් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත්කළ යුතු ය.

වෙන්දේසියේ මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතුයි. වෙනත් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිල දී ගනු ලැබූ භාණ්ඩ 2014 ජනවාරි මස 29 වැනි දින පැය 16.00 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත්කර ගත යුතුයි. එසේ ඉවත්කර නොගන්නා භාණ්ඩ පිළිබඳ වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

පී. සාලිය සී ද සිල්වා,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
හලාවත කොට්ඨාසය.

### පැරණි භාණ්ඩ ලේඛනය

| | | |
|---|---|---|
| 01. | සරනේරු | 06 |
| 02. | යතුර තහඩු | 01 |
| 03. | වතුර බොයිලේරු | 09 |
| 04. | තේ හැඳි | 01 |
| 05. | කේතල | 02 |
| 06. | පාපැදි මද්ගාඩ් | 02 |
| 07. | පිහිය | 03 |
| 08. | හිරමන | 01 |
| 09. | කුඩා බාල්දි | 32 |
| 10. | මේස විදුලි පංකා | 06 |
| 11. | වතුර ෆිල්ටර් | 03 |
| 12. | යකඩ පුටු කොටස් | 38 |
| 13. | විදුලි කේතල | 04 |
| 14. | යකඩ ඇඳුම් කබඩ් | 03 |
| 15. | යතුරු ලියන | 14 |
| 16. | පාපැදි | 10 |
| 17. | සීලින් විදුලි පංකා | 15 |
| 18. | මල්ටි පොට් | 01 |
| 19. | කැසට් රේඩියෝ | 03 |
| 20. | රූපවාහිනී යන්ත්‍ර | 04 |
| 21. | උඳුලු තල | 02 |
| 22. | ෆැක්ස් යන්ත්‍ර | 06 |
| 23. | පරිගණක කොටස් | 04 |
| 24. | මවුස් | 06 |
| 25. | මොනිටර් | 05 |
| 26. | යූ. පී. එස්. | 04 |
| 27. | මෙගා පෝන් | 01 |
| 28. | සී පී යූ | 03 |
| 29. | රෝනියෝ යන්ත්‍ර | 01 |
| 30. | ටියුබ් ලයිට් කට්ටල | 25 |
| 31. | ස්ටෑන්ඩ් ෆෑන් | 01 |
| 32. | වානේ කබඩ් | 05 |
| 33. | යකඩ පොත් රාක්ක | 02 |
| 34. | වායු සමන යන්ත්‍ර | 01 |
| 35. | ප්‍රින්ටර් | 02 |
| 36. | කටු කම්බි රෝල | 01 |
| 37. | ගෑස් ලිප් | 02 |
| 38. | සිල්ව කොප්ප | 12 |

01-339

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

කැනඩාවේ, වැන්කුවර්, B. B. V7J1W6 හි පදිංචි ග්‍රීන් ඇනට් වර්බෙනා වෙයි වන මම වැන්කුවර්, උතුරෙහි ප්‍රසිද්ධ නොතාරිස් මාර්ලින් ඒ. නීල්සන් විසින් සහතික කරන ලදුව ජාඇල, ඒකල, අගරදගුරු මාවත, අංක 24 හි පදිංචි (ස්ථිර වශයෙන් 7503 Cariboo Road Burnaby b. c. V3N4x2 හි පදිංචි) ජූන් යූ සහ ජා ඇල, ඒකල, අගරදගුරු මාවතේ අංක 22 හි පදිංචි විං චාන්ෆා වෙත පිරිනමන ලද විදේශ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර, අවලංගුකර බලරහිත කරන බවත්, මින් මතු එයට කිසියම් නෛතික බලයක් නොමැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත මෙයින් දැනුම් දී සිටිමි.

01-300

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඇල්ල ෆ්ලවර් ගාර්ඩින් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 95362
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 3 නේ කණුව, පස්සර පාර, ඇල්ල
ලියාපදිංචි දිනය : 2013 නොවැම්බර් මස 04 වැනි දින.

ඉහත සඳහන් සමාගමේ හි ලේකම්වරු.

01-249

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ප්ලෙනුස්කො (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 95829
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 86/3/ඩී/1 රොක්විව් ප්ලේස්, පහළකරගහමුණ, කඩවත
ලියාපදිංචි දිනය : 2013 නොවැම්බර් මස 29 වැනි දින.

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

01-250

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ක්‍රවුන් ග්ලෝබල් සර්විස් (පීවීටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී. වී. 95811
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 44, දටුම් අපාට්මන්ට්, ලොරිස් පාර, කොළඹ 04
ලියාපදිංචි දිනය : 2013 නොවැම්බර් මස 29 වැනි දින.

ඉහත සඳහන් සමාගමේ හි ලේකම්වරු.

01-251

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

නම : නාඳුගල පයනියර් පෙට්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය හා අංකය : 2013.05.30 පී වී 92782
ලියාපදිංචි කාර්යාලය : 363 "නිමල" එඩ්මන් මාවත, අම්බලන්වත්ත, ගාල්ල

01-256

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගම් නාමය : දාස ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 96008
සංස්ථාපන දිනය : 2013 දෙසැම්බර් මස 11 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 02, සුලෙයිමන් ටෙරස්, ජාවත්ත පාර, කොළඹ 05

ඩෙරික් සමරසේකර සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

01-288

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගම් නාමය : දාස ෂොපිං සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
අංකය : පී වී 96009
සංස්ථාපන දිනය : 2013 දෙසැම්බර් මස 11 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 02, සුලෙයිමන් ටෙරස්, ජාවත්ත පාර, කොළඹ 05

ඩෙරික් සමරසේකර සහ සමාගම,
සමාගම් ලේකම්වරු.

01-287

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදය යටතේ දැන්වීමයි

සමාගම : කැඩ් එක්ස්පර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 95777
ලියාපදිංචි කළ දිනය : 2013 නොවැම්බර් මස 27
කාර්යාලයේ ලිපිනය : අංක 189/ඒ, විල්ගොඩ පාර, කුරුණෑගල.

01-273

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : මාරා ඉසෝන් ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 95680
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාපිත කළ දිනය : 2013 දෙසැම්බර් මස 06 වැනි දින.

ඩී ඒ කම්පැනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

2013 දෙසැම්බර් මස 18 වැනි දින.

01-266

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 881311186 V හිමි කළිඳු තෙන්නකෝන් වන මා විදේශගත වීමේ දී නිකවැරටිය පදිංචි ජයපත්ම හේරත් මුදියන්සේලාගේ නීලා සෝමා ජයපද්මා ජා. හැ. අං. 517993409 V වෙත ප්‍රදානය කරන ලද නිකවැරටිය පදිංචි ඩබ්ලිව්. ටී. එම්. පී. බී. තෙන්නකෝන් ප්‍රසිද්ධ නෙතාරිස් තැන සහතික කළ අංක 13499 හා 2010 අගෝස්තු මස 06 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2013 දෙසැම්බර් මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසිකර වලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයට හා පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ටී. එම්. කළිඳු තෙන්නකෝන්.

01-235

---

### ඇටර්නි බලයක් අවලංගු කිරීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාවනැල්ල (තැපැල්) අරණායක පාර, අංක 41 දරන ස්ථානයේ පදිංචි, හැ. අංක 690361647 V හිමි දේවතාපේඩිගේ සරත් වන මම මාගේ ඇටර්නි බලකරු ලෙස හිඟුරක්ගොඩ (තැපැල්) යෝධඇල, බටුකොටුව, අංක 03 දරන ස්ථානයේ පදිංචි අස්සැල්ලලාගේ සිරියාවතී (හැ. අංක 658451294 V) යන අය පත්කරන ලද, ප්‍රසිද්ධ නොතාරිස් බණ්ඩාර අලුත්වත්ත මහතා ලියාසහතික කරන ලද අංක 3923 දරන 2006.07.17 දිනැති ඇටර්නි බලපත්‍රය 2013.12.20 වැනි දින සිට බලපවත්වන පරිදි අවලංගු කරන බවත්, එදිනෙන් පසු එකී මාගේ ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකින් මා නොබැඳෙන බවත්, ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

දේවතාපේඩිගේ සරත්,
ඇටර්නි අධිපති.

01-306

**2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය**

කන්ඩුල ටුවර්ස් (පීවීටී) එල්ටීඩී 2013 නොවැම්බර් මස 19 වැනි දින ලියාපදිංචි අංක පී වී 95614 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : අංක 71/12, සෙමෙට්‍රි පාර, පන්නිපිටිය.

මැග්නි කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්.

01-233/1

---

**2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය**

පියාදි ලංකා (පීවීටී) එල්ටීඩී 2013 නොවැම්බර් මස 04 වැනි දින ලියාපදිංචි අංක පීවී 95350 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : සන් ෂයින් පාර්ක්, හරුමල්ගොඩ, හබරාධූව.

ජෝතිරත්න කදිරහෙට්ටිආරච්චි,
ලේකම්.

01-233/2

---

**ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 5 වගන්තිය අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ඔෂිමා මාකටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65565
ලිපිනය : අංක 76/5, යුනියන් පෙදෙස, කොළඹ 02.

සමාගම් ලේකම්.

01-294

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ලැංඩේල් රිසෝට් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 78183
සංස්ථාගත කළ දිනය : 2011 අප්‍රේල් මස 04 වැනි දින
ලිපිනය : අංක 295, මාදම්පිටිය පාර, කොළඹ 14.

01-340

---

**2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ**

සමාගමේ නම : සොලුෂන් ඉන්ෆිනිටි (පී වී ටී) එල් ටි ඩී
සමාගමේ අංකය : පී වී 89952
ලියාපදිංචි කාර්යාලය : අංක 1/ඒ/1, උසාවි පාර, ඇල්දෙනිය, කඩවත
ලියාපදිංචි දිනය : 2012 දෙසැම්බර් මස 14 වැනි දින.

සමාගමේ ලේකම්වරු.

01-307

---

**සිත්රෝ ඇපරල් හෝල්ඩිංස් ලිමිටඩ්**

PB 1729

2007 අංක 07 දරන සමාගම් පනතේ 334 (1) වගන්තිය යටතේ ණයහිමියන්ගේ රැස්වීම පිළිබඳ කරනු ලබන නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 334, 335 සහ 336 යන වගන්ති වලට අනුකූලව වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 11.00 ට අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 03 දරන ස්ථානයේ දී ඉහත සමාගමෙහි ණය හිමියන්ගේ රැස්වීමක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (තව ද, එදින රැස්වීමට සහභාගි නොවන ණයහිමියන් වෙතොත් ණයහිමියන්ගේ රැස්වීමට පෙර දින පැය 48 පෙර අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 3 දරන ස්ථානයේ සමාගම් කාර්යාලයෙහි අදාළ පෙරකලාසි ගොනු කරන ලෙස ද, දැනුම් දෙනු ලැබේ.)

තව ද, ණයහිමියන්ගේ රැස්වීමට පෙර සියලු ණයහිමියන්ගේ හිමිකම්, සුරක්ෂිත ණය හිමියන්ගේ සුරක්ෂණ ප්‍රකාශ, ඒවා ලබාදුන් දිනයන්, සහ තක්සේරු කරනු ලැබූ වටිනාකම් සහිත ඡන්දය ප්‍රකාශ කිරීමේ අරමුණු ඉහත සඳහන් ලිපිනය දරන සමාගම් කාර්යාලය වෙත භාරදෙන ලෙස නිවේදනය කරනු ලැබේ.

සටහන : සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඇවරකරුවකු නම් කිරීම සහ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සඳහා පරීක්ෂණ කමිටුවක් අවශ්‍යතාවය මත මෙම රැස්වීමේ දී නම් කළ හැක.

සිත්රෝ ඇපරල් හෝල්ඩිංස් ලිමිටඩ් හි,
අධ්‍යක්ෂ මණ්ඩලය.

2013 වූ දෙසැම්බර් මස 19 වැනි දින දී ය.

01-345/1

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී**

සමාගමේ නම : නෙත් කන්ට්‍රැක්ටර්ස් (පීවීටී) එල් ටි ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 95858
ලියාපදිංචි කළ දිනය : 2013 දෙසැම්බර් මස 03 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 89, පහළ පිදුව, කුලියාපිටිය.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

01-263/1

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී**

සමාගමේ නම : මොණරාගල නර්සිං හෝම් (පීවීටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 82007
ලියාපදිංචි කළ දිනය : 2011 ඔක්තෝබර් මස 20 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 124, පොතුවිල් පාර, මොණරාගල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

01-263/2

---

**වොෂ්වර්ක්ස් ලිමිටඩ්**

PB 3273

2007 අංක 07 දරන සමාගම් පනතේ 334 (1) වගන්තිය යටතේ ණයහිමියන්ගේ රැස්වීම පිළිබඳ කරනු ලබන නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 334, 335 සහ 336 යන වගන්ති වලට අනුකූලව වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 10.30ට අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 03 දරන ස්ථානයේ දී ඉහත සමාගමෙහි ණය හිමියන්ගේ රැස්වීමක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (තව ද, එදින රැස්වීමට සහභාගි නොවන ණයහිමියන් වෙතොත් ණයහිමියන්ගේ රැස්වීමට පෙර දින පැය 48 පෙර අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 3 දරන ස්ථානයේ සමාගම් කාර්යාලයෙහි අදාළ පෙරකලාසි ගොනු කරන ලෙස ද, දැනුම් දෙනු ලැබේ.)

තව ද, ණයහිමියන්ගේ රැස්වීමට පෙර සියලු ණයහිමියන්ගේ හිමිකම්, සුරක්ෂිත ණය හිමියන්ගේ සුරක්ෂණ ප්‍රකාශ, ඒවා ලබාදුන් දිනයන්, සහ තක්සේරු කරනු ලැබූ වටිනාකම් සහිත ඡන්දය ප්‍රකාශ කිරීමේ අරමුණු ඉහත සඳහන් ලිපිනය දරන සමාගම් කාර්යාලය වෙත භාරදෙන ලෙස නිවේදනය කරනු ලැබේ.

සටහන : සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඇවරකරුවකු නම් කිරීම සහ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සඳහා පරීක්ෂණ කමිටුවක් අවශ්‍යතාවය මත මෙම රැස්වීමේ දී නම් කළ හැක.

වොෂ්වර්ක්ස් ලිමිටඩ් හි,
අධ්‍යක්ෂ මණ්ඩලය.

2013 වූ දෙසැම්බර් මස 19 වැනි දින දී ය.

01-345/2

---

**කෙල්සි ඇලුමිනියම් (ප්‍රයිවට්) ලිමිටඩ්**

PV 19815

**2007 අංක 07 දරන සමාගම් පනතේ 334 (1) වගන්තිය යටතේ ණයහිමියන්ගේ රැස්වීම පිළිබඳ කරනු ලබන නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 334, 335 සහ 336 යන වගන්ති වලට අනුකූලව වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 10.00ට අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 03 දරන ස්ථානයේ දී ඉහත සමාගමෙහි ණය හිමියන්ගේ රැස්වීමක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (තව ද, එදින රැස්වීමට සහභාගි නොවන ණයහිමියන් වෙතොත් ණයහිමියන්ගේ රැස්වීමට පෙර දින පැය 48 පෙර අංක 2, ඩීල් පෙදෙස, කොළඹ 3 දරන ස්ථානයේ සමාගම් කාර්යාලයෙහි අදාළ පෙරකලාසි ගොනු කරන ලෙස ද, දැනුම් දෙනු ලැබේ.)

තව ද, ණයහිමියන්ගේ රැස්වීමට පෙර සියලු ණයහිමියන්ගේ හිමිකම්, සුරක්ෂිත ණය හිමියන්ගේ සුරක්ෂණ ප්‍රකාශ, ඒවා ලබා දුන් දිනයන්, සහ තක්සේරු කරනු ලැබූ වටිනාකම් සහිත ඡන්දය ප්‍රකාශ කිරීමේ අරමුණු ඉහත සඳහන් ලිපිනය දරන සමාගම් කාර්යාලය වෙත භාරදෙන ලෙස නිවේදනය කරනු ලැබේ.

සටහන : සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඇවරකරුවකු නම් කිරීම සහ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සඳහා පරීක්ෂණ කමිටුවක් අවශ්‍යතාවය මත මෙම රැස්වීමේ දී නම් කළ හැක.

කෙල්සි ඇළුමිනියම් (ප්‍රයිවට්) ලිමිටඩ් හි,
අධ්‍යක්ෂ මණ්ඩලය.

2013 වූ දෙසැම්බර් මස 19 වැනි දින දී ය.

01-345/3

---

**සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුගාමීව, 2013 නොවැම්බර් මස 26 වැනි දින සිට බලගැන්වෙන පරිදි, පහත සඳහන් සමාගමේ නාමය (8 වගන්තියට අනුගාමීව) වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : යුනිකොන් ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 3009
ලිපිනය : අංක 06, 03 වන මහල, කෙළින් වීදිය, අනුරාධපුරය
සමාගමේ නව නාමය : යුනිකොන් ඉන්වෙස්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලේකම්වරු.

ගෘෆ් මැනේජ්මන්ට් ඇන්ඩ් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 141/3, වොක්ෂොල් වීදිය,
කොළඹ 02.

01-350

---

**සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නාමය : සිංහ ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 95981
සංස්ථාගත කළ දිනය : 2013 දෙසැම්බර් මස 10 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : 33 වන මහල, බටහිර කුළුණ, ඇචිලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂොල් වීදිය,
කොළඹ 02.

01-351

**දැන්වීමයි**

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.**

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය* |
|---|---|---|---|
| ප්‍රිමස් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 95999 | 2013.12.11 | අංක 24, ඇවරිහේන පාර, පොල්හේන්ගොඩ, කොළඹ 05 |
| ප්‍රිමියම් පැකේජිං සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 96111 | 2013.12.19 | අංක 39, ගුණසේකර උද්‍යානය, රාජගිරිය |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

01-259

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මාතර, අතුරලිය, ඉහල අතුරලිය පදිංචි වල්ලිවල ගමගේ ප්‍රදීප් හේමන්ත වන මම මාතර, ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. එන්. දයාරත්න මහතා විසින් ලියා සහතික කළ අංක 12793 හා 2013.01.18 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් මාතර, ඉසදීන් නගරයේ, අකුරැස්ස පරේ. අංක 49 හි පදිංචි වල්ලිවල ගමගේ ඩග්ලස් ද සිල්වා මහතා වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමින් අවලංගු කරන අතර ඔහු විසින් මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

01-291

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - යාපනය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාවන් තුළ, නගර මධ්‍යයේ ස්ටැන්ලි පාරේ පිහිටි, පරයන්කාඩු නොහොත් පනන්ගඩු නමැති ඉඩමට බලයලත් මානක එම්. රාමචන්ද්‍රන් විසින් 1977.10.23 වැනි දින සාදන ලද පිඹුරු අංක 2811 නිරූපිත ලොට් 01 සිට ලොට් 06 වශයෙන් බෙදා වෙන් කර ඇති උඩු මහල සහිත සාප්පු සංකීර්ණයේ පිහිටි ලොට් 5 දරන ඉඩම් කොටස හා සාප්පු ගොඩනැගිල්ල ඇතුලු සියලු දේ. ප්‍රමාණය කේ. එල්. එස්. 6.75.

මෙම දේපළ, මහේෂ්වරන් මතීසන් සහ මතීසන් කුමුතිනී බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - යාපනය මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට කස්තුරියර් පාරේ ස්ටැන්ලි පාර හන්දිය දක්වා පැමිණ දකුණට හැරී යාර 100ක් පමණ ගමන් ගෙන දුම්රිය හරස් පාර පසුකරන විට සහ ආරියකුලම් මංසන්ධියට පෙර අදාළ දේපළ පිහිටා තිබේ.

2014 ක්වූ පෙබරවාරි මස 05 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.11.26 වැනි දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී, (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661828, 011-2661826, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/071-4755974/071-8446374/077-7761706.

01-296

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - කිලිනොච්චි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය සභා සීමාවේ මුරසුමෝඩ්ඩායි උපකාර්යාල සීමාවන් තුළ පරන්තන් - මුලතිව් - පුනරින් මංසන්ධියේ යාපනය - නුවර (ඒ 9) මාර්ගයට මායිම්ව පිහිටි මුරසුමොඩ්ඩායිකාඩු නමැති ඉඩමට බලයලත් මානක එස්. රවීන්ද්‍රනායගම් විසින් 2011.01.12 වැනි දින සාදන ලද අංක 29383 පිඹුරේ නිරූපිත බෙදා වෙන් කර ඇති ලොට් 1 සහ ලොට් 2 දරන ඉඩම් කොටස් දෙක සහ එහි පිහිටි සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 40.

මෙම දේපළ, තම්බිපිල්ලේ විග්නේෂ්වරී උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මෙම දේපළ පරන්තන් මංසන්ධියේ සිට මීටර් 100ක් පමණ දකුණු දෙසට ගමන් ගත් විට නුවර යාපනය (ඒ 9) මාර්ගයට මායිම්ව පිහිටා තිබේ.

2014 ක්වූ පෙබරවාරි මස 05 වැනි දින ප. ව. 3.00 ට ආරම්භ වන වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.15 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.10.31 වැනි දින, අයිලන්ඩ්, ලක්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නුවර පාර, කිලිනොච්චිය.

දුරකථන අංක : 021-2280100/021-2280101/021-2280102.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071-4755974/071-8446374/077-7761706
දුරකථන ෆැක්ස් අංකය : 081-2210595.

01-295

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - කිලිනොච්චි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කෙන්ගල්ල ගමේ පිහිටි අන්ගන්තැන්න එස්ටේට් නොහොත් අන්කඳුරේවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ආර්. ආර්. ජේ. ආර්. ජයකොඩි විසින් 2007.06.27 වැනි දින සාදන ලද පිඹුරු අංක 100බී හි සඳහන් ලොට් 2/278 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල ඇතුලු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 12.15

ඉහත කී මානක තැන විසින් 2006.10.28 වැනි දින අංක 531 බී පිඹුරේ සඳහන් ලොට් ආර් 1 සහ පිඹුරු අංක 100 බී හි සඳහන් ලොට් R 25, R 27, R 28 දරන මාර්ග ප්‍රවේශය උඩින් යටින් සහ ඔස්සේ සහ පා ගමන්, වාහන ගමනාගමනය සඳහා පාවිච්චි කිරීමේ අයිතිය ද, විදුලි සංදේශ කේබල්, විදුලි කේබල් ජල වහන පද්ධති, ජලාපවහන පද්ධති ජල පද්ධති එලීම සහ උඩින් වයර් ඇදීම සහ අනෙකුත් සියලු දේ ද සමග වේ.

මෙම දේපළ, තම්බිපිල්ලේ විග්නේෂ්වරී උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මහනුවර සිට දිගන මාර්ගයේ කි. මී. 13.50 පමණ කෙන්ගල්ල නගර මධ්‍යය දක්වා පැමිණ දකුණට හැරී අඹකොටේ පාරට පිවිස මීටර් 800ක් ගිය පසු දකුණට හැරී වික්ටෝරියා රේන්ජ් නිවාස සංකීර්ණය පාරේ මීටර් 400ක් පමණ දේපළ කාර්යාලය අසළින් කලාප 11 (Zone 11) පාරට පිවිස තවත් මීටර් 200ක් ගමන් ගෙන වමට සන්සෙට් ඇවනිව් (Sunset Avenue) දෙසට හැරී තවත් මීටර් 100 - ටී හන්දිය දක්වා ගමන් ගෙන වමට හැරුණු විට කොන්ක්‍රීට් පාර සුපර් ටෙක්ටෝනියා නිවාස දෙසට දිස් වේ. මෙම පාරේ මීටර් 25ක් පමණ ගිය විට අදාළ දේපළ පිහිටා තිබේ.

2014 ක්වූ ජනවාරි මස 31 වැනි දින පෙ. ව. 10.00 ට ආරම්භ වන වෙන්දේසියේ දී මා විසින් විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.15 වැනි දින ද අයිලන්ඩ්, ලක්බිම, හා තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී., නුවර පාර, කිලිනොච්චිය.

දුරකථන අංක : 021-2280100/021-2280101/021-2280102.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 071-4755974/071-8446374/077-7761706
දුරකථන ෆැක්ස් අංකය : 081-2210595.

01-298

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මාතලේ ශාඛාව

#### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සිව් මහල් නිවාස ගොඩනැගිල්ලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතලේ මහ නගර සභා සීමාවන් තුළ මාතලේ නගරයේ ගොඩපොල පාරේ පිහිටි පල්ලියලිවජියාර් වත්ත නොහොත් සියඹලාගහමුල වෙදරාලගේ වත්ත නමැති ඉඩමට -

01. බලයලත් මානක කේ. කුමාරසාමි විසින් මැන සාදන ලද 1975.07.30 වැනි දින අංක 6031 පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද වරිපනම් අංක 22 දරන ඉඩම් කොටස හා සියලු දේ. ප්‍රමාණය : පර්චස් 3.59,

02. බලයලත් මානක කේ. සමරසිංහ විසින් මැන සාදන ලද 1993.04.21 වැනි දින අංක 1159 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන වරිපනම් අංක 20 නමැති ඉඩම් කොටස හා සියලු දේ.

ඉඩම් ප්‍රමාණය පර්චස් 3.40 (ඉඩමේ මුළු ප්‍රමාණය පර්චස් 6.99)

*දේපලට පිවිසීම.-* මාතලේ කෙලින් වීදියේ සිට ගොඩපොල පාරට පිවිස මීටර් 100ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව මුහන්දිරම් පාර මංසන්දියට ඉදිරිපසින් අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ මොහොමඩ් තජුඩීන් මොහොමඩ් රියාස් සහ මොහොමඩ් රවුෆ් නූර් ජෙසිමා නොහොත් සිත්ති ජෙසීමා යන අය බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2014 ක් වූ ජනවාරි මස 31 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.04.26 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2013.04.30 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකාරතැන (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661826, 011-2661828, 011-2661835.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/071-4755974/071-8446374/077-7761706.

01-297

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කෑගල්ල ශාඛාව

#### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගල්බොඩගම ගමේ කුරුණෑගල කොළඹ ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි ලිහිණියාගොල්ලේහේන සහ මොරහේන නමැති ඉඩමට බලයලත් මානක ඒ. ඒ. පත්මදාස විසින් 2008.08.25 වැනි දින සාදන ලද අංක 5146 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 01 හා ලොට් 02 දරන ඒකාබද්ධ ඉඩම හා එහි පිහිටි සියලු දේ. ඉඩමේ මුළු ප්‍රමාණය : පර්චස් 70 (ලොට් 01, පර්චස් 50, ලොට් 02, පර්චස් 20)

මෙම ඉඩම එක් ඒකකයක් වශයෙන් විකුණනු ලැබේ.

මෙම දේපළ මොහොමඩ් ජලීල් මොහොමඩ් ඉෆ්තිකාර් නොහොත් ඉෆ්තිකාර් ජලීල් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- කුරුණෑගල-කොළඹ මාර්ගයේ පොල්ගහවෙල හන්දිය දක්වා පැමිණි විට පාරේ දකුණු පසින් පිහිටි රෝහණ ඉන්ධන පිරවුම්හලට මෙපිටින් අදාළ දේපළ පිහිටා තිබේ.

2014 ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2013.12.09 වැනි දින ඩේලි මිරර්, ලක්බිම, තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකාරතැන (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ටී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661826, 011-2661828, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/071-4755974/071-8446374/077-7761706.

01-299

---

## නුගේගොඩ දිසා අධිකරණය

### වටිනා ඉඩම් කැබලි 26ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුගේගොඩ දිසා අධිකරණයේ අංක 10/08/එම්. බී දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති අධිකාරී පත්‍රයට අනුව රු. 2,059,189.98 ක මුදලක් වර්ෂ 1995.07.01 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 30% ක පොලියක් ද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ දින සිට මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුළු මුදල මත එම අනුප්‍රමාණය මත වූ වැඩිදුර පොලිය ද අය කර ගැනීම සඳහා පහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2014ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පෙ. ව. 11.00 ට ආරම්භ වන පරිදි එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.* -
හෝමාගම නගරයේ සිට හයිලෙවල් පාර ඔස්සේ ගොඩගම හන්දිය පසු කර හමුවන මීගොඩ මහා විද්‍යාලය ඉදිරිපසින් ඇති පාසල් මාවතේ මීටර් 200ක් පමණ ගිය විට වම් පසට වන්නට මෙම දේපළ පිහිටා තිබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ මැද පත්තුවේ, ගැහැණුවල නම් ගමෙහි පිහිටි "රුක්ගහකොටුවලන්ද" නම්වූ ඉඩමට වරලත් මිනින්දෝරු එස්. රාසාප්පා විසින් වර්ෂ 1986 ජුනි 23 වැනි දින මැන සාදන ලද අංක 317 පිඹුර ප්‍රකාර කැබලි අංක 4 (පර්චස් 10), අංක 7 (පර්චස් 10), අංක 11 (පර්චස් 15.75), අංක 12 (පර්චස් 12.5), අංක 14 (පර්චස් 10), අංක 15 (පර්චස් 16.5), අංක 16 (පර්චස් 14.5), අංක 17 (පර්චස් 12.5) අංක 18 (පර්චස් 11.5), අංක 19 (පර්චස් 11.5), අංක 21 (පර්චස් 18.5) අංක 22 (පර්චස් 10.9) අංක 25 (පර්චස් 10.5), අංක 26 (පර්චස් 10), අංක 27 (පර්චස් 8.5) අංක 28 (පර්චස් 12.5), අංක 29 (පර්චස් 12.5), අංක 30 (පර්චස් 7.5), අංක 31 (පර්චස් 19.5), අංක 32 (පර්චස් 18), අංක 34 (පර්චස් 7.5), අංක 38 (පර්චස් 11), අංක 39 (පර්චස් 15), අංක 40 (පර්චස් 13.5), අංක 42 (පර්චස් 10), අංක 43 (පර්චස් 10).

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල්, දේපළ ගැණුම්කරුවන් විසින් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම මුදල් බැංකු අණකරයකින් හෝ මුදලින් පමණක් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් සියයට විසි පහක (25%) මුදලක්, ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත නුගේගොඩ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

02. වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ *ගැසට් පත්‍රය* සහ පුවත් පත් දැන්වීම් ඇතුලු සියලුම ප්‍රචාරක වියදම් හා විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු, ලිපිකරු හා සෝෂක ගාස්තු,

03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සම්පූර්ණ ගැණුම් මුදලින් සියයට දෙකහමාරක් (2 1/2%),

04. ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුලු ගැණුම් මුදලෙන් සියයට එකක (1%) විකුණුම් බද්ද.

හිමිකම් පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා විමසන්න.

ඇවරකරු,
සීමාසහිත යූනියන් ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්
(දැනට ඈවරකෙරෙමින් පවතින)
අංක 02, කාසල් පටුමග,
කොළඹ 04
දුරකථන අංක : 2553179, 2508874.

ඒ. ඒ. ආර්. ප්‍රේමලතා මිය,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා වෙන්දේසිකරු.

දිසා අධිකරණය,
නුගේගොඩ.
අංක 115/1, පී. එස්. පෙරේරා මාවත,
මාම්පෙ, පිළියන්දල.
දුරකථන අංක : 4917701, 2617660, 077-9662738.

01-348

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අක්කරෙයි පත්තු ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ එඬේරමුල්ල, "දවටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්. ගුණසේකර විසින් මැන සාදන ලද 1996.07.20 වැනි දින අංක 181 දරන පිඹුරෙහි ලොට් අංක "1" හි ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) ක් විශාල ඉඩම, ගොඩනැගිලි, සහ සියලුම දේත් සමග වේ. (අංක 1421 සහ 907 දරන බැඳුම්කරවල දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති ලොට් "24" දරන මාර්ග අයිතිය ද සමග වේ.)

මෙම දේපළ තුවාන් ඉස්වාන් හසීම් යන අය ණයකරු ලෙස හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දාවූ ද, 2003.03.06 වැනි දින අංක 907 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2005.10.13 වැනි දින අංක 1421 දරන බැඳුම්කරයන් යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 31 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට මීගමුව පාරේ කිලෝමීටර් 8ක් වූ දුරක් වත්තල හන්දියට පැමිණ, දුම්රියපොළ පාරට දකුණට හැරී, මහර පාරේ කිලෝමීටර් 3.75ක් වූ දුරක් ගෙවා එඬේරමුල්ල හන්දියට පැමිණ වමට හැරී විජය කුමාරතුංග මාවතට (කලින් හොගිතොට පාර) හැරී මීටර් 100ක් පමණ ගොස් අවසානයේ සම්පාය මාවතට වමට හැරී මීටර් 300ක් පමණ දුරක් යන්න. මෙම දේපළ පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

*යෝජනා සම්මුතිය සඳහා .- රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2013ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින ද, ලක්බිම, ඩේලිමිරර් සහ තිනකරන් පුවත්පත් වල වර්ෂ 2013ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% ක්ද,
4. ලිපිකරු සහ සෝෂක වේතනය රුපියල් 1000ක් ද, සහ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රුපියල් 2,000 ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවානිම කළ යුතුවේ. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 011 2661826, 011-2661828.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු මුළු දිවයිනටම.

කාර්යාලය : අංක 25 බී, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011-5756356,
ෆැක්ස් අංකය : 075-0883265, 011-2334808.

01-362